৭ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2237/20 - 2021 ජූලි මස 20 වැනි අඟහරුවාදා - 2021.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත

**බලතල පැවරීමේ නියෝග (සංශෝධන)**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2(2) වැනි වගන්තියෙන් දකුණු පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල, එකී පළාත් සභාව විසුරුවා ඇති හෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ වගන්තියෙන් මා වෙත පැවරී ඇති අතර, එකී බලතල ප්‍රකාරව දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මම දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීම සඳහා සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් ලෙස පත්කර ඇත්තාවූ පියදිගොඩ ලියනගේ භාග්‍යා චතුරානි ලියනගේ යන අය හට 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ හා ඒ යටතේ පනවා ඇති රීති ප්‍රකාරව සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇති එකී උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියලු බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් එනම් 2020.01.01 වැනි දින සිට පැවරීම සඳහා මා විසින් 2020.03.16 දින ලබාදුන් අනුමැතිය 2020.07.03 දින දරන අංක 2182/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ අතර, එකී බලතල ලබාදීම 2020.01.03 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු වගට පෙර කී නියෝගය පහත පරිදි සංශෝධනය කරමි.

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2021 පෙබරවාරි මස 16 වැනි දින,
ගාල්ලේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| පියදිගොඩ ලියනගේ භාග්‍යා චතුරානි ලියනගේ මිය | 2020.01.03 | සමුපකාර සමිති පනතේ : 3, 5, 6, 7, 8, 9, 33, 39, 42, 43, 44, (44 (6) හැර) 45, 46, 48, 49, 50, 52, 53, 54, 58, (58 (2) (අ) හා 58 (5) හැර) 59, 68 හා 72 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල.<br><br>රීති මාලාවේ : 4, 11, 15, 16, (II), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, (49 xii හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල. |

07 - 709

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.